# ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි

## අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ ගොඩනැගිලි පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**1. සම්බන්ධ වන ආයතන :**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1. | දෙපාර්තමේන්තුව : තැපැල් | යොමු අංකය | 11/01/23/2012 | දිනය | 2012.04.27 |
| 1.2. | අමාත්‍යාංශය : තැපැල් සේවා | යොමු අංකය | 12121 උපගොනුව | දිනය | 2012.05.21 |
| 1.3. | කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය | DMS/C04/28-01 | දිනය | 2011.07.28 |
| 1.4. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය | EST-2/RECRU/02/0219 | දිනය | 2012.07.18 |
| 1.5. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | NSCC/2/48/21/SR | දිනය | 2012.05.18 |
| 1.6. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය | PSC/EST/2/1/28/2/1/2012 | දිනය | 2013.12.10 |

**2. පත්කිරීමේ බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැපැල්පති

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර-තාක්ෂණික

3.2. ශ්‍රේණි - මෙම සේවා ගණය සඳහා ශ්‍රේණි 3 කි.

- 111 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය
- 1 ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්, නඩත්තු හා අළුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි වැනි මට්ටමට නොඅඩු මට්ටමේ ප්‍රවීණතා / කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**4.** **තනතුරේ ස්වභාවය :**

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි

**5.** **වැටුප් :-**

5.1. වැටුප් කේත අංකය :- MN 3 – 2006 (ඒ)

5.2. වැටුප් පරිමාණය :- රු.15,005/- - 4 x 180 – 6 x 240 – 11 x 320 – 20 x 360 – 27,885/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| 111 ශ්‍රේණිය: | පියවර 01 | රු. 15,005/- |
| 11 ශ්‍රේණිය | පියවර 12 | රු. 17,485/- |
| 1 ශ්‍රේණිය | පියවර 23 | රු.21,045/- |

**6.** **සේවා ගණයට අයත් තනතුර / තනතුරු :**

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| | අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | | කාර්යයන් |
|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි පරීක්ෂක | III | 03 | i | නව ගොඩනැගිලි ඉදිකිරීම, නවීකරණය කිරීම, අළුතින් එකතු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාමාණික බිල්පත් සහ ඇස්තමේන්තු සකස් කිරීම. |
| | | | | ii | ඉහත සඳහන් කාර්යයන් සඳහා අවශ්‍යවන්නාවූ සැලසුම් හා සිතියම් සකස් කිරීම. |
| | | | | iii | ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අදාල මිණුම් ගණනය කිරීම සහ දත්ත එකතු කිරීම. |
| | | | | iv | අවශ්‍යතාවය පරිදි තාක්ෂණික ඇගයුම් කමිටුවල රාජකාරි ඉටු කිරීම. |
| | | | | v | අවශ්‍යතාවය අනුව අදාල වැඩ බිම් වලට ගොස් තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම හා අදාල කාර්යයන් පරීක්ෂා කිරීම. |
| | | | | vi | ගෙවීම් සඳහා ඉදිරිපත් කරනු ලබන බිල්පත් පරීක්ෂා කර ඒ අනුව කාර්යයන් ඉටු වී තිබේදැයි සනාථ කරගෙන සිවිල් ඉංජිනේරුවරයාගේ සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම. |
| | | | | vii | පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් තැපැල් මූලස්ථානයට ලැබෙන ප්‍රාදේශිකව කැඳවූ මිළ ගණන් ඇතුලත් ඇස්තමේන්තු පරීක්ෂාකර නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීම. |
| | | | | viii | සිවිල් ඉංජිනේරුවරයාගේ ඉල්ලීම මත සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාල වෙනත් ඕනෑම කාර්යයන් ඉටු කිරීම සඳහා දායකත්වය ලබාදීම. |

6.2 ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාව :- 03

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය :

### 7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත තරග විභාගයෙන් | 70% |
| සීමිත තරග විභාගයෙන් | 30% |
| කුසලතා මත | - |

සටහන:

I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව තුන (03) ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

### 7.2. විවෘත බඳවා ගැනීම:

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්:

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

1 භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය,විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

2 අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය/ ශුද්ධ ගණිතය/ සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන්ගෙන් සියළුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :

මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව රැකියා ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව.
3. ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව.
4. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.
5. විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.
6. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම.
7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3. පළපුරුද්ද : අදාල නොවේ.

7.2.2.4. කායික සුදුසුකම් :

1. සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. (රජයේ රෝහලක වෛද්‍යවරයෙකු විසින් සනාථ කළ යුතුය.)

7.2.2.5. වෙනත් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18 යි.

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 30 යි.

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය - විවෘත බඳවා ගැනීම

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.4.1. ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

විභාග පටිපාටිය සහ විෂයය නිර්දේශය ඇමුණුම I හි දැක්වේ.

7.2.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : තැපැල්පති

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

7.3.2. සුදුසුකම්:

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම්:

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය හා විද්‍යාව යන විෂයනට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 6 කින් සුදුසුකම් ලබා තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම්:

7.2.2.2 හි සඳහන් වෘත්තීය සුදුසුකම් අදාළ වේ.

7.3.2.3. පළපුරුද්ද:

ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහළ සේවා ගණයක අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2.4. කායික සුදුසුකම්:

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

(i). පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

(ii). තනතුරට අදාළ ක්ෂේත්‍රයක ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක දෙපාර්තමේන්තුගත තනතුරක පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(iii). සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.3. වයස : අදාළ නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

විභාග පටිපාටිය සහ විෂයය නිර්දේශය ඇමුණුම II හි දැක්වේ.

7.3.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : තැපැල්පති

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම : අදාල නොවේ.

## 8. කාර්යක්ෂමතා කඩඉම :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

**9. භාෂා ප්‍රවීණතාව :**

| | භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | බඳවා ගැනීම රාජ්‍ය භාෂාවෙන් කෙරෙන හෙයින් අදාල නොවේ. |
| 02 | අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම :**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

සටහන - 1 වන හා 2 වන දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා අදාළ වන විෂය නිර්දේශයන් ඇමුණුම III හා ඇමුණුම IV මගින් දක්වා ඇත.

**සංලක්ෂය : :**

1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11. තනතුරු වලට පත් කිරීම**

අදාල නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :**

මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සහ කොන්දේසි ද අදාළ වේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:**

සක්‍රීය සේවා කාලය :

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

අදාළ නොවේ.

**15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**16. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි අදාල වේ.**

සකස්කළේ : අත්සන :- ..............................  පරීක්ෂා කළේ : අත්සන :- ..............................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)  (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

| | | | |
|---|---|---|---|
| නම : | පී.ඩබ්.පී. විජේසිංහ | නම : | අසෝක මාම්පිටියආරච්චි |
| තනතුර : | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) | තනතුර : | නියෝජ්‍ය තැපැල්පති (පාලන) |
| දිනය : | 2014.01. 29 | දිනය : | 2014.01. 24 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : 2014.01. 29.

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති ..............................

යොමු අංකය : 12121

ශ්‍රී ලංකා තැපැල් තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : හේමසිරි ප්‍රනාන්දු
ලේකම්,
තැපැල් සේවා අමාත්‍යාංශය

දිනය : 2014.01. 30

නිල මුද්‍රාව : හේමසිරි ප්‍රනාන්දු ලේකම් තැපැල් සේවා අමාත්‍යාංශය තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, අංක. 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. ..............................

යොමු අංකය : PSC/EST/2/1/28/2/1/2012

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2013 - 12 - 10 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014 . 02 19

නිල මුද්‍රාව : ඩී. එම්. එල්. සී. සේනාරත්න ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අංක. 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ-05. ..............................

ඇමුණුම I

**01.** විභාගයේ නම : අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය.

**02.** විභාගය පිළිබඳ විස්තර : විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

| | විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

**03.** විභාග පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාවය මත පවත්වනු ලැබේ.

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | විෂයයන් | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | ශ්‍රී ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලන, ක්‍රීඩා හා මෑත කාලයේ සිදුවූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබා ගත් ජයග්‍රහණයන්ද ඇතුළුව) ලෝකයේ සිදුවූ වැදගත් සිදුවීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යයන්. අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය පිළිබඳ මැන බැලීම. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මාන, සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මඟින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම. |

සටහන : අයදුම්කරුවන් සිංහල / දෙමළ එක් භාෂාවකින් පමණක් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

සකස්කළේ :

අත්සන :- ............................................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2014.01. 29

පරීක්ෂා කළේ :

අත්සන :- ............................................

නම :- අසෝක සංම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2014.01. 29

අත්සන :- ............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර :- තැපැල්පති

දිනය :- 2014.01. 29

ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

නිල මුද්‍රාව :- ............................................

ඇමුණුම II

**01.** විභාගයේ නම : අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ශ්‍රේණියේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය.

**02.** විභාගය පිළිබඳ විස්තර : විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

| | විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

**03.** විභාග පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :
අවශ්‍යතාවය මත පවත්වනු ලැබේ.

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | විෂයයන් | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | ශ්‍රී ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලන, ක්‍රීඩා හා මෑත කාලයේ සිදුවූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබා ගත් ජයග්‍රහණයන්ද ඇතුළුව) ලෝකයේ සිදුවූ වැදගත් සිදුවීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යයන්.<br>අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය පිළිබඳ මැන බැලීම. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මාන, සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මඟින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම. |

සටහන : අයදුම්කරුවන් සිංහල / දෙමළ එක් භාෂාවකින් පමණක් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

| සකස්කළේ : | | පරීක්ෂා කළේ : | |
|---|---|---|---|
| අත්සන :- | ........................................ | අත්සන :- | ........................................ |
| නම :- | පී.ඩබ්.පී. විජේසිංහ | නම :- | අශෝක මාම්පිටියආරච්චි |
| තනතුර :- | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) | තනතුර :- | නියෝජ්‍ය තැපැල්පති (පාලන) |
| දිනය :- | 2014.01. 29 | දිනය :- | 2014.01. 29 |

| | | |
|---|---|---|
| අත්සන | :- | ........................................<br>(දෙපාර්තමේන්තු ප්‍රධානියා) |
| නම | :- | බී.එල්.පී.ආර්. අභයරත්න |
| තනතුර | :- | තැපැල්පති |
| දිනය | :- | 2014.01. 29. |
| නිල මුද්‍රාව | :- | බී. එල්. පී. ආර්. අභයරත්න<br>තැපැල්පති........................................ |

## ඇමුණුම III

1. විභාගයේ නම : අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ 111 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවැත්වෙන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු පරීක්ෂණය - තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

3. විභාගය පවත්වන බලධරයා : තැපැල්පති විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලැබේ.

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දෙපාර්තමේන්තු පරීක්ෂණය - තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | ගොඩනැගිලි ඉදිකිරීම<br>01. ගොඩනැගිලි ඉදිකිරීම<br>i ගඩොල් බැම්ම හා කළුගල් බැම, බැම් වැඩ සන්ධි, මුලු, ආරුක්කු ආදිය, අත්තිවාරම් තෙත්වැටි, ලින්ටල්.<br>ii බදාම මිශ්‍රණ වර්ග, කපරාරු සිමෙන්ති දැමීම, අවසාන නිමාව.<br>iii සිමෙන්ති මිශ්‍රණ,ස්ථානීය කොන්ක්‍රීට් වැඩ, ලින්ටල් හා කොන්ක්‍රීට් වැඩ.<br>02. වඩු වැඩ හා අලංකරණ වැඩ<br>i නොයෙකුත් වර්ගවල සන්ධි කිරීම, පුලුක්කු කිරීම, තම්ම ගෑම, වැද්දීම, ඉරුප්පු කිරීම, කුඩුම්බි කිරීම, ජේකඩ සෑදීම, තනාතු කපා වැද්දීම, හැඩ මුවට්ටුව, කත්තමල්ලි මූට්ටුව, යටලී මූට්ටුව හා හේත්තු වැද්දීම ආදිය.<br>ii නොයෙකුත් වර්ගයේ කාප්ප වහලවල් තැනීම, තනි කුරුපා කාප්ප, ද්වි කුරුපා කාප්ප, බැඳුම් වහල, දෙපළ වහල, තනිපල වහල ආදිය.<br>03. වහලවල වැඩ<br>i නොයෙකුත් වර්ගවල වහලවල්, අස්බැස්ටස් තහඩු වහල, ඇලුමිනියම් තහඩු වහල, සිංහල උළු වහල, රට උළු වහල. |

04. තීන්ත ආලේප කිරීම

i නොයෙකුත් වර්ගවල තීන්ත ආලේප කිරීම, බිත්ති ආලේප කිරීම, දැව ආලේප වර්ග, වාර්නිෂ් ආලේප, යකඩ හා ලෝහ සඳහා ආලේප කිරීම යනාදිය.

05. පාරවල්

i බෝක්කු සහ පැති බැම්වලට තුල් ගැසීම, ඒවා ඉදිකිරීම හා ඒවා ඉදිකිරීම සඳහා යොදන ද්‍රව්‍ය පිළිබඳ දැනුම.

ii විවිධ පරතර සඳහා තාවකාලික ලී පාලම් තැනීම.

iii මාර්ග සඳහා අත්තිවාරම සකස් කිරීම, ගල් අතුරා තාර දැමීම, බොරළු දැමීම, මතුපිට ජල අපවහනය, කොන්ක්‍රීට් පාරවල් සෑදීම.

06. පරීක්ෂණ

i බැහුම් පරීක්ෂණය ඇතුළු කොන්ක්‍රීට් සඳහා වන අනෙකුත් පරීක්ෂණ

ii දැව වර්ගීකරණය.

iii දැව පදම් කිරීම.

iv ගඩොල් ඇතුරූ බිම.

v සම්පීඩක ඇතුරුම් ගඩොල්.

vi බිත්තිවලට සහ බිමට අල්ලන ටෙරාසෝ හෝ සෙරමික් ටයිල් ඇල්ලීම.

6. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත විභාගයේදී පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.

සකස් කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- පෝෂ්‍ය පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2014.01. 29

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අසෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2014.01. 29

අත්සන :- ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර :- තැපැල්පති

දිනය :- 2014.01. 29

නිල මුද්‍රාව :- ඩී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති ..............................

ඇමුණුම IV

01 විභාගයේ නම : අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ 11 වන ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවැත්වෙන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය.

02 විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු පරීක්ෂණය - තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

03 විභාගය පවත්වන බලධරයා : තැපැල්පති විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලැබේ.

04 විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව වසරකට දෙවරක්

05 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දෙපාර්තමේන්තු පරීක්ෂණය - තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | ඇස්තමේන්තු කිරීම, ප්‍රමාන ගැනීම හා පිරිවිතර සකස් කිරීම<br>(අ) කොටස<br>01. පහත සඳහන් විෂයන් සඳහා ප්‍රමාන සටහන් හා ඇස්තමේන්තු සකස් කිරීම ආදිය.<br>(ඒ) ගොඩනැගිලි.<br>(බී) මූලික ජල සම්පාදනය හා ජලඅපවහනය.<br>(සී) මූලික පාරවල් කුඩා ප්‍රමාණයේ ඉදිකිරීම් සහිතව.<br>(ආ) කොටස<br>01. ඉදිකිරීම් වැඩ, මාර්ග සහ ජල සම්පාදන වැඩ හා විදුලි වැඩ සඳහා සම්පූර්ණ විස්තර පිරිවිතරයන් සකස් කිරීම.<br>(ඇ) කොටස<br>01. වාර්ෂික මිලදී ගැනීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, ජල සැපයුම් සඳහා වූ ද්‍රව්‍ය හා විදුලිය සැපයීම සඳහා වූ ද්‍රව්‍ය<br><br>දෙපාර්තමේන්තු අවශ්‍යතා හඳුනා ගැනීම<br>ටෙන්ඩර් කැඳවීම සඳහා ලැයිස්තු සැකසීම හා ඇස්තමේන්තු කිරීම පිළිබඳ දැනුම.<br>සටහන -<br>මෙම දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන නොයෙකුත් මාදිලියේ ගොඩනැගිලි හා අවශ්‍ය පාරවල් සඳහා යොදා ගනු ලබන ක්‍රම පිළිබඳ විස්තරාත්මක දැනුමක් අපේක්ෂා කෙරේ. |

| | |
|---|---|
| | 02. සැලසුම් පිළියෙල කිරීම හා පිටපත් කිරීම.<br>(අ) සපයන ලද දළ සටහන් අනුව, වැඩ සඳහා සැලසුම් පිළියෙල කිරීම.<br>සටහන -<br>ලකුණු දෙනු ලබන්නේ නිරවද්‍යතාව, පිරිසිදුකම හා වේගය මතය.<br>දෙපාර්තමේන්තුව මගින් ඉදිකරනු ලබන සාමාන්‍ය වර්ගයේ ගොඩනැගිලි සඳහා වූ සැලසුම් සපයනු ලැබේ.<br><br>03. ගෙවීම සඳහා මිනුම් ගැනීම, ප්‍රමාණපත්‍ර වලට අනුකූලව බිල් සෑදීම ආදිය සඳහා වන ක්‍රියා.<br><br>04. දෙපාර්තමේන්තු රෙගුලාසි.<br>(අ) කාර්යාලයීය කළමනාකරණයෙහි ස්වභාවය සහ අභිප්‍රාය.<br>(ආ) වාර්තා කළමනාකරණය.<br>(ඇ) උපකරණ හා ගබඩා.<br>(ඈ) සටහන් හා වාර්තා.<br>(ඉ) දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙල. |

06 තනතුරට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත විභාගයේදී පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.

සකස් කළේ :

අත්සන :- ....................................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2014.01. 29

පරීක්ෂා කළේ :

අත්සන :- ....................................

නම :- අසෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2014.01. 29

අත්සන :- ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර :- තැපැල්පති

දිනය :- 2014.01. 29

නිල මුද්‍රාව :- ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති....................................